ස්ථාන කිහිපයක අද උදෑසන ඇති වූ පිපිරීම් නිසා ජීවිතහානි වූ සියලු දෙනාට සහ ඔවුන්ගේ පවුල්වල සියලුදෙනාටත්, තුවාල සිදු වූ සියලු දෙනාටත් රජය වෙනුවෙන් කණගාටුව ප්‍රකාශ කිරීමට කැමතියි. මේ සිදුවීම් රටත්, එවගේම රටේ ආර්ථිකයත් අස්ථාවර කිරීමේ බරපතල තත්වයක් ලෙස මා දකිනවා.

විශේෂයෙන්ම ආගමික ස්ථාන හා ප්‍රධාන හෝටල් කිහිපයක් ඉලක්ක කොට ගෙන එල්ල වූ මෙම ප්‍රහාර මා තරයේ හෙලා දකිනවා. නීතිය ආරක්ෂා කිරීමට අප සියලු දෙනා කටයුතු කල යුතුයි. ඒ සඳහා අවශ්‍ය සියලුම පියවර ගන්නා ලෙසට මා ආරක්ෂක ලේකම් වෙතත් ත්‍රිවිධ හමුදාපතිවරුන් හා පොලිස්පති වෙත අවශ්‍ය උපදෙස් ලබා දී තිබෙනවා.

මමත් ඒවගේම අනෙකුත් ඇමතිවරුනුත් ගරු ජනාධිපතිතුමා සමඟ ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කලා. මෙම සාකච්ඡාව සඳහා ජනාධිපති ලේකම්, නීතිපති තුමා, මුදල් අමාත්‍යාංශ ලේකම් හා ආපදා කලමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ද සහභාගී වුනා.

දැනට මේ සිදුවීම් ගැන පැවැත්වෙන පොලිස් පරික්ෂණ වලින් අනතුරුව මේ සඳහා වගකිව යුතු පුද්ගලයින් කුමන තරාතිරමකට අයත් වූවත් ඔවුන්ට එරෙහිව දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කරන බව සඳහන් කරන්නට කැමතියි.

ශ්‍රී ලංකාවේ අප සැමවාම මේ ජාතික අර්බුදකාරී අවස්ථාවේ ඉවසීමෙන් කටයුතු කර සාමය ආරක්ෂා කරමු.

ස්තුතියි !



(3/6)